# 23 උදාන ගී


23.1 රූපය - දේව මාතාවෝ

නමෝ මරියනි.... නමෝ මරියනි
නමෝ මරියනි ප්‍රසාද පූර්ණ වන්තිනි

දේව පුත්‍රයා ස්ප්‍රීතු සාන්තු වරමිනා....//
පිළිසිඳීය දෙව් බෙලෙන්
ශ්‍රී ඔබේ කුසේ....//

කීර්ති පෑ ශ්‍රීයා සාමදනයේ පියා....//
සාරසේ දිලි සිරිත්
ශ්‍රී ඔබේ කුසේ....//

i. මෙම ගීතිකාවේ දී ගායනා කරන්නේ කුමන සිද්ධියක් සම්බන්ධයෙන් ද?
ii. මෙම ගීතිකාවෙන් ප්‍රකාශ වන්නේ මොනවා ද?

දෙවියන් වහන්සේගෙන් ලත් විපුල වරප්‍රසාද හමුවේ විවිධ පුද්ගලයන් උන්වහන්සේට ප්‍රශංසා කරමින් ගායනා කළ ගීතිකා තුනක් නව ගිවිසුමේ දක්නට ලැබේ.

## 1. මරිය තුමියගේ උදාන ගීය (ලූක් 1:46-55)

මරිය තුමිය විසින් එලිසබෙත් තුමිය බැහැදැකීමට ගොස් සෙකරියස් තුමාගේ ගෙට ඇතුළු වී එලිසබෙත් තුමිය හට ආචාර කළ විට ඇයගේ කුසෙහි දරුවා ඉපිලෙන්නට විය. එවිට එලිසබෙත් තුමිය ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ ව මරිය තුමියට ප්‍රශංසා කළ විට මරිය තුමිය මෙසේ උදන් ඇනුවා ය;

මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි,
මාගේ සිත මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි;
මක්නිසාද, එතුමාණෝ සිය දාසියගේ දීනතාව
කුළුණු පාමින් සලකා වදාළ සේක.
හැම පරපුරක් ම මෙතැන් සිට, භාග්‍යවන්තී ය'යි මට කියනු ඇත.
පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක.
"පරිශුද්ධයාණෝ" යනු එතුමන්ගේ නාමය ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

එතුමන්ගේ දයාව සිය බැතිමතුන් කෙරේ, පරපුරෙන් පරපුරට පැතිරේ.
සිය බාහුවෙන් එතුමාණෝ විකුම් පා, උඩඟු උදම් සිතැත්තන් විසුරුවා හැර,
මහ නරපතීන් සිය සිහසුන්වලින් පහත හෙළා,
දීනයන් ඉහළ නංවා උසස් කළ සේක. සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා,
ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක.
අප පියවරුන් වූ ආබ්‍රහම්ට හා එම පරපුරට,
සදහට ම පොරොන්දු වූ දයාව සිහි කරමින්
සිය සෙනඟ හට, පිහිට වූ සේක.

(ලූක් 1:46-55)

## 2. සෙකරියස් තුමාගේ ප්‍රශංසා ගීතය (ලූක් 1:68-79)

ගොළු ව සිටි සෙකරියස් තුමා ස්නාවක ජුවාම් තුමාගේ උත්පත්තියෙන් දින 8කට පසු කථා ශක්තිය ලැබ දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් මෙසේ පැවසී ය.

ඉශ්රායෙල්හි දෙවි සමිඳාණන්, සිය සෙනඟ වෙත බලා කරුණාවෙන්,
විමුක්තිය සලසා දුන් බැවින්, එතුමන් හට තුති පැසසුම් වේ වා!
සිය දාසයා වූ දාවිත්ගේ වංශයෙන් අප හට, බලවත් මිදුම්කාරයෙකු එතුමාණෝ එවූ සේක....
එසේ වූයේ, පෙර ශුද්ධ දිවැසිවරුන්ගේ මුවින් පැවසූ ලෙස ය.
රුපුන්ගෙන් හා අපට වෛර බැන්දවුන්ගෙන්,
අප මුදලන පිණිස, එතුමාණෝ එය කළ සේක;
මෙසේ, අප පියවරුන්ට කළ දයා පොරොන්දුව ඉටු කර,
සිය ශුද්ධ ගිවිසුම සිහි කළ සේක. එය අප පිය ආබ්‍රහම්ට
එතුමන් දිවුළ දිවුරුම ය.
මෙසේ කළේ, අප සතුරන්ගෙන් මිදීම ලබමින්,
නොබිය ව එතුමන්ගේ සේවයේ යෙදෙමින්,
එතුමන් අබිමුවෙහි බැතියෙන් හා දැහැමින්, දිවි ඇති තෙක් විසීමට ය.
ළදරුව, ඔබ සමිඳුන්ට පෙරටුව යමින්, එතුමන් මඟ පිළියෙළ කරන බැවින්,
මෙහෙසුරු දිවැසිවර යන නම ඔබට දෙනු ඇත.
එතුමන්ගේ සෙනඟට පව් කමාවෙන් ලැබෙන ගැළවීම,
ඔබ ඔවුන්ට දන්වන්නෙහි ය. අප දෙවිඳුණෝ මෘදු ය, දයාවන්ත ය.
අප කෙරෙහි අහසින් ළහිරු රැස් උදා කරවන සේක.
අඳුරේ හා මරණ සෙවණේ සිටින්නවුන් කෙරෙහි,
එලෙසින් එළිය උදා කරවමින් සෙත් මඟ යාමට අපට මඟපෙන්වන සේක.

(ලූක් 1:68-79)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## 3. සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීතය (ලූක් 2:29-32)

ළදරු ජේසුස් වහන්සේ පිළිබඳ ව ව්‍යවස්ථාවෙහි සඳහන් වත්පිළිවෙත් ඉටු කරනු වස්, දෙමවුපියන් උන්වහන්සේ දේව මාලිගාවට ගෙනා විට, සිමියොන් තුමා උන්වහන්සේ දෝතින් වඩාගෙන මෙසේ දෙවියන් වහන්සේට ප්‍රශංසා කළේ ය;

සමිඳුනි, ඔබ පොරොන්දු වූ ලෙස ම
දැන් ඔබ දාසයා හට,
ශාන්ති සිතින් යාමට
ඔබ නිදහස දී ඇත,
මන්ද,
ගැළවීම මාගේ දෙනෙතින් දිටිමි. එය සකල ජාතීන් අබිමුව කළ ගැළවීම ද විජාතීන්ට එළිය දෙන ආලෝක ද ඔබේ සෙනඟ වන ඉශ්රායෙල්වරුන්ගේ මහිමය ද වේ.

(ලූක් 2:29-32)

කිතුනු අප ද දිනපතා යාච්ඤාව තුළ දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට යොමු විය යුතු ය.

ක්‍රියාකාරකම



1. ශුද්ධ බයිබලයේ නව ගිවිසුම තුළ දක්නට ලැබෙන උදාන ගී **තුනක්** නම් කරන්න.
2. මරියාවන්ගේ උදාන ගීතයෙන් අවධාරණය කරන්නේ කුමක් ද?
3. "ප්‍රීතිමත් අවස්ථාවන්හි දී දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ යුතු ය" යන ප්‍රකාශයට ඔබ කොතෙක් දුරට එකඟ වන්නේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.



**ජීවිතයට බිඳක්**

*ඔබගේ ජීවිතයේ ප්‍රීතිමත් අවස්ථාවල දී දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන්න.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.